# හපුතලේ ප්‍රාදේශීය සභා නව බහුකාර්ය ගොඩනැගිල්ලේ පළමු මහල අලුතෙන් ඉදිකරන ලද කඩ කාමර අංක 01 සහ 02 වසර 10 ක් සදහා වෙන වෙනම  බදු දීම සදහා ලංසු කැදවීම

# ප්‍රසම්පාදන ඉල්ලුම් පත්‍රය


**හපුතලේ ප්‍රාදේශීය සභාව**

සැ.යු.

මෙයට අමුණා ඇති ප්‍රසම්පාදන ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කර අත්සන් තබා ප්‍රසම්පාදන කොන්දේසි හා උපදෙස් මාලාව ද සම්පූර්ණ කොට අත්සන් තබා පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතුය.


**හපුතලේ ප්‍රාදේශීය සභා බහු කාර්ය ගොඩනැගිල්ල**
**හපුතලේ ප්‍රාදේශීය සභාව**
**දියතලාව**

## බහු කාර්ය ගොඩනැගිල්ල පළමු මහල කඩ කාමර සැලැස්ම




FIRST FLOOR PLAN
SCALE: 8'-0": 1 INCH

## භුගෝලිය සිතියම



# ලංසුකරුවන්ට උපදෙස් හා ප්‍රසම්පාදන කොන්දේසි

## <u>හපුතලේ ප්‍රාදේශීය සභා නව බහුකාර්ය ගොඩනැගිල්ලේ පළමු මහල අලුතෙන් ඉදිකරන ලද කඩ කාමර අංක 01 සහ 02 වසර 10 ක් සදහා වෙන වෙනම බදු දීම සදහා ලංසු කැදවීම</u>

පහත දැක්වෙන කොන්දේසී වලට අනුකූලව ප්‍රසම්පාදන ගිවිසුමෙන් එකගවන්නා වූ දින සිට වර්ෂ දහයක් (10) කාලයක් සදහා නව බහුකාර්ය ගොඩනැගිල්ලේ පළමු මහල අලුතෙන් ඉදිකරන ලද කඩ කාමර අංක 01 සහ 02 වසර 10 කට වෙන වෙනම බදු දීම සදහා හපුතලේ ප්‍රාදේශීය සභා ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති විසින් ලංසු කැදවනු ලැබේ.

ගොඩනැගිල්ලේ පිහිටීම හා කඩ කාමර විස්තර (දළ සැලැස්ම ,ප්‍රසම්පාදන ලියකියවිලි වල අන්තර්ගතව ඇත )
ගොඩනැගිලි විස්තරය කඩ අංක යෙදුම පහත සදහන් පරිදිය.

| ගොඩනැගිලි විස්තරය | කාමර අංකය | එක් කඩ කාමරයක් සදහා අවම ලංසුව (රුපියල්) | මාසික කුලිය (රුපියල්) | ආපසු ගෙවන ප්‍රසම්පාදන තැන්පත් මුදල (රුපියල්) | ආපසු නොගෙවන ආකෘති පත්‍ර ගාස්තුව (රුපියල්) |
|---|---|---|---|---|---|
| වර්ග අඩි 577.61 | අංක 01 | 828000.00 | 13000.00 | 50,000.00 | 5,000.00 |
| වර්ග අඩි 558.03 | අංක 02 | 828000.00 | 13000.00 | 50,000.00 | 5,000.00 |

ප්‍රසම්පාදන අයදුම්පත් නිකුත් කිරිම 2024.11.14 සිට 2024.12.04 දින ප.ව 3.00 දක්වා කාර්යාල වේලාව තුළ දී නිකුත් කරනු ලබන අතර ප්‍රසම්පාදන අයදුම්පත් භාර ගැනිම 2024.12.05 දින පෙ.ව 10.30 ට අවසන් වේ. ප්‍රසම්පාදන අයදුම්පත් භාරගැනීම අවසන් වූ වහාම ( 2024.12.05 පෙ.ව 10.30 ට ) හපුතලේ ප්‍රාදේශීය සභාවේ රැස්වීම් ශාලාවේ දී සිදු කෙරේ.

**01. ප්‍රසම්පාදන ඉල්ලුම් කිරීමට සුදුසුකම්**

1. ප්‍රසම්පාදන ඉල්ලුම්කරුවන් ප්‍රසම්පාදන ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ කර ඇති ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුය.

2. දැනටමත් හපුතලේ ප්‍රාදේශීය සභාව සතු කඩ කාමර හෝ වෙනත් බදුකරයක් ලබාගෙන ඇති ඉල්ලුම්කරුවන් විසින් ඉල්ලීම් කරනු ලබන ප්‍රසම්පාදන ඉල්ලුම්පත් නිකුත් කරනු ලබන්නේ ඔවුන් විසින් අදාළ බදුකරය වෙනුවෙන් ගෙවිය යුතු බදු හෝ කුලී මුදල් ප්‍රසම්පාදන ඉල්ලුම්පත් නිකුත් කරන දිනට කලින් අවසන් වූ මාසය දක්වා හිගයකින් තොරව ගෙවා ඇත්නම් පමණි.

3. අසාධු ලේඛනගතව ඇති ඉල්ලුම්කරුවන් සදහා ටෙන්ඩර් අයදුම් කළ නොහැක.

**02. ලංසු ඉදිරිපත් කිරීම**

1. ලංසු ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීමේ දී මිල ගණන් ඇතුළු සියලු තොරතුරු නොමැකෙන නිල් පැහැති තීන්ත පෑනකින් ලිවිය යුතු අතර, සම්පූර්ණ ලංසු මුදල අකුරින් සහ ඉලක්කමෙන් සදහන් කර තිබිය යුතුය. (කිසියම් ආකාරයකින් මෙම මිළ ගණන් වෙනස්ව පවතී නම් ලංසුකරු විසින් අකුරින් දක්වන ලද මිල නිවැරදි මිල ලෙස ගණන් ගනු ලැබේ)

2. ලංසු ලියවිලි සම්පූර්ණ කිරීමේ දී වැරදි නිවැරදි කිරීමට සිදුවන්නේ නම් එය තනි ඉරකින් කපා නැවත නිවැරදිව ලියා අත්සන යොදා සහතික කළ යුතුය. (වැරදි නිවැරදි කිරීම සදහා ටිපෙක්ස් භාවිතා නොකරන්න)

3. සම්පූර්ණ කරනු ලබන ලංසු පත් පිටපත් දෙකකින් යුතුව පිළියෙල කර එහි මුල්පිටපත හා අනුපිටපත යනුවෙන් සදහන් කර හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් "හපුතලේ ප්‍රාදේශීය සභා නව බහුකාර්ය ගොඩනැගිල්ලේ පළමු මහල කඩ කාමර අංක 01 සහ 02 වසර 10 ක් සදහා වෙන වෙනම බදුදීම සදහා ලංසු කැදවීම" යනුවෙන් නිකුත් කරන ලිපි කවර වල බහා ලංසුකරුගේ නම ලිපිනය පැහැදිලිව සදහන් කර මුද්‍රා තබා සභාපති, ප්‍රසම්පාදන කමිටුව, හපුතලේ ප්‍රාදේශීය සභාව, දියතලාව ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ හපුතලේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ සභා ලේකම් නිළ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හැකිය.

4. ඉල්ලුම්පත්‍රය සමග පහත ලියවිලි ඉදිරිපත් කළ යුතුය.

| **මුල් පිටපතට අඩංගු විය යුතු ලේඛන** | | **අනු පිටපතට අඩංගු විය යුතු ලේඛන** | |
|---|---|---|---|
| 1 | ප්‍රසම්පාදන ඉල්ලුම් පත්‍රය | 1 | ප්‍රසම්පාදන ඉල්ලුම් පත්‍රය පිටපත |
| 2 | උපදෙස් හා කොන්දේසි මාලාව | 2 | උපදෙස් හා කොන්දේසි මාලාව ඡායා පිටපත |
| 3 | ප්‍රසම්පාදනපත් භාරගන්නා අවසාන දිනට මාස 6 ක් ඇතුළත ලබාගන්නා ග්‍රාම නිළධාරි පදිංචි සහතිකය (කඩ කාමර දෙකටම ඉල්ලුම් කරන්නේ නම් සහතික කරන ලද පිටපතක් ) | 3 | ප්‍රසම්පාදනපත් භාරගන්නා අවසාන දිනට මාස 6 ක් ඇතුළත ලබාගන්නා ග්‍රාම නිළධාරි පදිංචි සහතිකය ඡායා පිටපත |
| 4 | ආපසු ගෙවන ඇප තැන්පතුවේ කුවිතාන්සි ඡායා පිටපත | 4 | ආපසු ගෙවන ඇප තැන්පතුවේ කුවිතාන්සි ඡායා පිටපත |
| 5 | ජාතික හැදුණුම්පත /වලංගු රියදුරු බලපත්‍රය ඡායා පිටපත | 5 | ජාතික හැදුණුම්පත /වලංගු රියදුරු බලපත්‍රය ඡායා පිටපත |

5. අසම්පූර්ණ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. අදාළ වැඩිදුර විස්තර දුරකථන අංක 057-2229075/0572050038 මෙම කාර්යාලයෙන් K.G.A.I.A. කුමාර මහතා අමතා හෝ www.haputhaleps.com වෙබ් අඩවියෙන් haputhale pradeshiyasabha FB පිටුවෙන් ලබාගත හැකිය.

**03. ලංසු විවෘත කිරීම**

ලංසුපත් භාරගැනීම 2024-12-05 වන දින පෙ:ව: 10.30 ට අවසන් වන අතර ලංසු භාර ගැනිම අවසන් වූ වහාම හපුතලේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට පැමිණ එය නිරීක්ෂණය කළ හැකිය.

**04. ලංසු ඇප තැන්පතුව/ ආපසු නොගෙවන ලංසු ලියවිලි ගාස්තු**

1. ලංසු ලියවිලි සමග ආපසු ගෙවනු ලබන රුපියල් 50,000.00 ක ලංසු ඇප තැන්පතු වටිනාකම සහ ආපසු නොගෙවනු ලබන රු 5,000.00 ක ලංසු ලියවිලි ගාස්තු හපුතලේ ප්‍රාදේශීය සභා කාර්යාලයට මුදලින් ගෙවා ලබාගත් ලදුපත් හෝ සභා ලේකම්, හපුතලේ ප්‍රාදේශීය සභාව යන නමට ලංකා බැංකුවේ දියතලාව ශාඛාවේ ගිණුම් අංක 3535487 වෙත සෘජුවම බැර කර ලබාගත් රිසිට්පත් හි ඡායා පිටපත් ලංසුපත සමග අමුණා ඉදිරිපත් කළ යුතුය.

**05. ලංසු කොන්දේසි**

1. මෙම බදු කාලසීමාව වසර 10 (දහය) ක් සදහා පමණක් වලංගු වේ. තෝරාගනු ලබන බදුකරු හපුතලේ ප්‍රාදේශීය සභාව සමග විධිමත් ගිවිසුමකට එළඹිය යුතුයි.

2. සාර්ථක ලංසුකරු තෝරාගෙන ගිවිසුම්ගත වීමෙන් පසුව අනෙකුත් ප්‍රතික්ෂේප කරනු ලබන ලංසුකරුවන්ගේ ලංසු ඇප තැන්පතුව නිදහස් කරනු ලැබේ.

3. කෙසේ වෙතත් අවම ලංසුවට වඩා අඩුවෙන් ඉල්ලුම් කරන ලද හා ප්‍රසම්පාදන අයදුම්පත් ලබාගෙන ප්‍රසම්පාදන ඉදිරිපත් නොකරණ ඉල්ලුම් කරුවන්ගේ ආපසු ගෙවන ඇප තැන්පත් මුදල් සභාව සතු කරනු ලැබේ.

4. වසර දහය (10) සදහා නැවත නොගෙවන එකවර ගෙවිය යුතු මුදල (ප්‍රසම්පාදනකරු ඉදිරිපත් කරන මුදල) බදු ගිවිසුම අත්සන් කරන දින 75% ක් ද, ඉතිරි 25% ක මුදල යතුරු භාරදෙන අවස්ථාවේ ද වනසේ සම්පූර්ණ මුදල් ගෙවීම් කළයුතුය. සාර්ථක ලංසුකරු විසින් ලංසු පිළිගැනීමේ ලිපිය ලැබී වැඩ කරන දින 14 ක් ඇතුළත හපුතලේ ප්‍රාදේශීය සභාවේ සභාපති /සභා ලේකම් සමග බදු ගිවිසුම අත්සන් කළ යුතුය.

5. ගැනුම්කරු විසින් ගෙවීමට එකග වන මාසික කඩ කුලී මුදල ගිවිසුම්ගත දිනෙන් වසර 3ක් සඳහා වලංගු වන අතර ඉන් අනතුරුව නැවත රජයේ විධිමත් තක්සේරු වාර්තාවක් මත මාසික කඩ කුලී මුදල සංශෝදනය වේ. මේ අනුව වසර තුනෙන් තුනට ලබාගන්නා රජයේ තක්සේරු වාර්තාවේ වටිනාකම් සාර්ථක බදුකරු ටෙන්ඩර් අවස්ථාවේ දී එකග වූ වටිනාකම ඉක්මවන්නේ නම් එම නව තක්සේරු මුදල ඉදිරි වර්ෂ සදහා නැවත සංශෝධනය වනතෙක් බදු කාල සීමාවට අදාළව මාසිකව අඛණ්ඩව ගෙවිය යුතු වේ.

6. සාර්ථක ලංසුකරු විසින් නියමිත කාල පරිච්ඡේදය තුළ බදු ගිවිසුම අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළහොත් ලංසු ඇප තැන්පතුව අහිමි කිරීම හෝ / සහ ප්‍රසම්පාදන මණ්ඩලය විසින් පණවනු ලබන වෙනත් කුමන හෝ තීරණයකට යටත් විය යුතු වේ.

7. මෙම බදු පදනම මත ලබාගන්නා කඩ කාමර අංක 01 හෝ 02 සදහා, මාසික ජල/ විදුලි බිල්පත් හා රජය විසින් කලින් කල නියම කරනු ලබන බදු මුදල් ද බදු ගැනුම්කරු විසින් ගෙවිය යුතුය.

8. බදු කාලසීමාව තුළ බදු ගැණුම්කරු විසින් එකී දේපළවල ආරක්ෂාව සම්බන්ධයෙන් වගකිව යුතු අතර, බදු කාලසීමාව අවසානයේ දී අදාළ කඩ කාමරය පරික්ෂාවකින් අනතුරුව හපුතලේ ප්‍රාදේශීය සභාව වෙත විධිමත්ව භාරදිය යුතු වේ. අදාළ කඩ කාමරයේ බාහිර සැලැස්මට කිසිදු ආකාරයකින් වෙනස්වීමක් නොවිය යුතු අතර, අනුමත අභ්‍යන්තර කඩ කාමර සැලැස්මේ වෙනස්කම් සිදුකරන්නේ නම් අනුමත සැලැස්මට හානියක් නොවන පරිදි සිදුකළ හැකි අතර, ඒ පිළිබද පූර්ව අනුමැතිය හපුතලේ ප්‍රාදේශීය සභාවෙන් ලබාගත යුතුය.

9. බදු ලබාගන්නා බදුකරු හැර වෙනත් කිසිදු අතුරු පාර්ශවයකට අතුරු බදුදීම නොකළ යුතුයි.

10. ජාතිවාදී, ආගම්වාදී, කටයුතු හෝ සංස්කෘතික හානි සිදුවිය හැකි කටයුතු සහ වෙනත් පුද්ගලයින් හෝ ආයතන විවේචනය විය හැකි කටයුතු සිදු නොකළ යුතුය.

11. පවත්වාගෙන යාමට බලාපොරොත්තු වන ව්‍යාපාරය පිළිබදව හපුතලේ ප්‍රාදේශීය සභාවේ එකගතාවය ලබාගත යුතුය.

12. බදු කාලසීමාව අවසානයේ අදාළ නිශ්චල දේපළ හපුතලේ ප්‍රාදේශීය සභාව සතුවන අතර, ඉවත් කර ගෙන යාමට ඉඩ දෙනු නොලැබේ.

13. බදු කාලසීමාවේ දී තෙවන පාර්ශවයට සිදුවන හානි සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම බදු ගැනුම්කරු සතු වේ. ව්‍යාපාර කටයුතු වල දී කඩ කාමරයේ අභ්‍යන්තර බාහිර පරිසරයේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සහ අපජල කළමනාකරණය පිළිබද වාර්ථාවක් හපුතලේ ප්‍රාදේශීය සභාව වෙත ලබාදිය යුතු අතර එම වාර්ථාවට අනුව අදාළ කටයුතු සිදුවිය යුතුයි.

14. ඉදිරිපත් කරනු ලබන ලංසුපත් හපුතලේ ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කරන අතර, එය පිළිගැනීම හෝ නොපිළිගැනීම අවසන් බලය ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

15. දෙවන පාර්ශවය කිසියම් වූ සාධාරණ හේතුවක් මත ගිවිසුමෙන් ඉවත්වීමට අදහස් කරන්නේ නම් ඒ බව අවම වශයෙන් මාස 3 කට පෙර ලිඛිත දැනුම් දීමකින් පමණක් සිදුකළ යුතුය.

16. පිළිගත් ප්‍රසම්පදාන කරුවන් විසින් ප්‍රසම්පාදන කොන්දේසි අනුව කටයුතු කිරීම ප්‍රතික්ශේප කරනු ලැබුවහොත් ඔවුන්ගේ ඇප මුදල් සභා සන්තක කරන අතර ප්‍රසම්පාදන සම්බන්ධයෙන් වරදක් කරනු ලැබූ අයෙකු සේ සලකා අසාදු ලේඛණයට ඔවුන්ගේ නම් ඇතුලත් කරනු ලැබේ.

17. ප්‍රමාද වී ලැබෙන ප්‍රසම්පාදනපත් එය බහා ඇති කවරය විවෘත නොකරම ප්‍රතික්ෂේප කරන අතර තැපෑලෙදි අස්ථානගත වන ප්‍රසම්පාදන පිළිබදව සහ ප්‍රසම්පාදනය සදහා ඉදිරිපත් නොකර ප්‍රසම්පාදන පිළිබදව කිසිදු වගකීමක් භාරගනු නොලැබේ. එබැවින් ප්‍රසම්පාදන වෙනුවෙන් ගෙවා ඇති ප්‍රසම්පාදන තැන්පත් මුදල් ද ආපසු ගෙවනු නොලැබේ.

18. වලංගු බදු කාලසීමාව එනම්, වසර 10 (දහය) කාලසීමාවෙන් පසුව නැවත මිළ ගණන් කැදවීමේ අයිතිය හපුතලේ ප්‍රාදේශීය සභාව සතු වන්නේ ය.

**06. බදු ශිවිසුම අත්සන් කිරීම**

1. සාර්ථක ඉල්ලුම්කරුවන් විසින් නියමිත මුදල් ගෙවීමෙන් පසු, බදු ශිවිසුම අත්සන් කිරීම සදහා ලංසුව පිරිනමා දින 14 ක් ඇතුළත නියම කරනු ලබන දිනක හපුතලේ ප්‍රාදේශීය සභාවේ සභාපති හා සභා ලේකම් ඉදිරියේ සිදුකළ යුතුය.

2. ශිවිසුම සදහා මුද්දර ගාස්තු බදුකරු විසින් ගෙවිය යුතුය.

3. කඩ කාමරයේ බදු අයිතිය භාර දෙනු ලබන්නේ (යතුරු භාරදීම) මෙම ශිවිසුම අත්සන් කිරීමෙන් පසු හපුතලේ ප්‍රදේශීය සභාවට ගෙවිය යුතු ආපසු නොගෙවන එකවර ගෙවිය යුතු තැන්පත් මුදල, ආරක්ෂිත ඇප තැන්පත් මුදල වන මාස හයක කඩ කුලී මුදල යන සියලුම ගාස්තු ගෙවීමෙන් පසුව වන්නේ ය.

සභාපති
ප්‍රසම්පාදන කමිටුව
හපුතලේ ප්‍රාදේශීය සභාව
දියතලාව

| ඉල්ලුම් කරන කඩ කාමර අංකය | |
|---|---|

# හපුතලේ ප්‍රාදේශීය සභාව

**හපුතලේ ප්‍රාදේශීය සභා නව බහුකාර්ය ගොඩනැගිල්ලේ පළමු මහල අලුතෙන් ඉදිකරන ලද කඩ කාමර අංක ............... වසර 10 ක කාලයකට බදු දීම සඳහා ලංසු කැඳවීම - ලංසු පත්‍රය.**

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :-..........................................................................................
..........................................................................................

02. ඉල්ලුම්කරුගේ ස්ථිර ලිපිනය :-..........................................................................................
..........................................................................................

03. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය :-..........................................................................

04. සම්බන්ධ කළ හැකි දුරකථන අංක 1. ස්ථාවර :-..................................................................
2. ජංගම :-..................................................................

05. දිස්ත්‍රික්කය :-..........................................................................................

06. I. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :-..........................................................................................
II. ග්‍රාම නිළධාරි කොට්ඨාශය :-..........................................................................................

07. දැනටමත් හපුතලේ ප්‍රාදේශීය සභාව සතු කඩ කාමරයක් හෝ වෙනත් බදුකරයක් ලබාගෙන ඇති අයෙක් ද යන්න, එසේනම් ඒ පිළිබඳව විස්තර සඳහන් කරන්න. (කඩ අංකය හා පිහිටීම)
..........................................................................................
..........................................................................................

08. අපේක්ෂිත වෙළඳ ව්‍යාපාරය ..........................................................................................
අපේක්ෂිත වෙළඳ ව්‍යාපාරය සඳහා සභාවේ අනුමැතිය ලබාගත යුතු අතර, මෙම වෙළඳ මධ්‍යස්ථානයේ මස් කඩ, මාළු කඩ වෙළඳාම සඳහා අවසර දෙනු නොලැබේ.

09. ලංසු ඇප තැන්පතු ගාස්තුව (ආපසු ගෙවන) රු :-..................................................................
1 ලදුපත් අංකය :-..................................................................
2 දිනය :-..................................................................

10. ලංසුකරු ඉදිරිපත් කරන මිල ගණන්

ඉලක්කමෙන් (රුපියල්) :-..........................................................................................

අකුරෙන් :-..........................................................................................
..........................................................................................

11. ගිවිසගත් කාල සීමාව තුළ දී හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් ලබාදෙන උපදෙස් හා කොන්දේසිවලට යටත්ව සේවාවන් සිදුකිරීම සඳහා මම මෙයින් කැමැත්ත ප්‍රකාශ කරමි.

12. ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීමෙන් පසු දින 7 ක් තුළ ගිවිසුම් අත්සන් කර දින 60 ක් ඇතුළත සේවාව ආරම්භ කිරීමට මම එකග වෙමි.

13. මෙම සේවාව පවත්වාගෙන යාම හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් නියම කර ඇති ප්‍රමිතීන් ට අනුකූලව වන බවට සහතිකර වෙමි.

14. මම බංකොලොත් භාවයෙන් තොර අයෙක් වන අතර, නීතිවිරෝධී, සමාජ විරෝධි ක්‍රියාවන්හි නිරතව අපරාධ නීතිය යටතේ උසාවියකින් දඬුවම් ලබා නොමැති බවට සහතික වෙමි.

15. හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් නියම කර ඇති හා කාලීනව නියම කරනු ලබන ප්‍රමිතීන් හා සියලු කොන්දේසී පිළිගෙන ඒ අනුව සේවා පවත්වාගෙන යන බවට සහිතක වෙමි.

16. ඉහත ප්‍රකාශකර ඇති කරුණු මාගේ දැනීමට අනුව සත්‍ය වන අතර, ඉහත සදහන් කිසිවක් වැරදි සහගත යැයි අනාවරණය වුවහොත් මාගේ ප්‍රසම්පාදන ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප වන බවත්, ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීමකින් අනතුරුව වුවද, වැරදි සහගත ප්‍රකාශනයක් අනාවරණය වීමක දී හෝ හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් නියමකර ඇති කොන්දේසි උල්ලංගනය කළ බවට සනාථ වූ විටක දී ටෙන්ඩරය අවලංගු වන බව ද මම පිළිගනිමි.

17. ඉල්ලුම් කරන ඉහත අංක දරණ කඩ කාමරය බදුගැනීමෙන් අනතුරුව වෙනත් කිසිදු පුද්ගලයෙකුට විකිණීම නොකරන බව සහතික වෙමි.

18. සුදුසු ටෙන්ඩර්කරුවෙකු වශයෙන් තෝරාගත් පසු දින 14 ක් තුළ හපුතලේ ප්‍රාදේශීය සභාව සමග නෛතික ගිවිසුමකට එළඹෙන බවට කැමැත්ත ප්‍රකාශ කරමි.

................................................ ඉල්ලුම්කරුගේ අත්සන :-.......................................................

දිනය ඉල්ලුම්කරුගේ නම :-.......................................................

ජාතික හැදුණුම්පත් අංකය

## සැළකිය යුතුයි

ඉල්ලුම්කරු සමාගමක්/හවුල් ව්‍යාපාරයක් නම් පහත විස්තර ද ඉදිරිපත් කරන්න.

අත්සන් කරුගේ නම :-.........................................................................

තනතුර :-.........................................................................

සමාගමේ/හවුල් ව්‍යාපාරයේ නිල මුද්‍රාව

**මෙම අයදුම්පත්‍රය සමග පහත ලේඛන අමුණා ඉදිරිපත් කරමි.**

| | |
|---|---|
| 1. ඉල්ලුම් ඇප තැන්පතුවේ ලදුපත (ඡායා පිටපතක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ) | |
| 2. ජාතික හැදුණුම්පත ඡායා පිටපත. | |
| 3. මාස 6 ක් ඇතුළත ලබා ගන්නා ලද පදිංචිය සනාථ කරන ග්‍රාම නිළධාරී සහතිකය මුල් පිටපත | |
| 4. ප්‍රසම්පාදන අයදුම්කරු අත්සන් කරන ලද ප්‍රසම්පාදන කොන්දේසි මාලාව. | |

| ඉල්ලුම් කරන කඩ කාමර අංකය | |
|---|---|

# හපුතලේ ප්‍රාදේශීය සභාව

**හපුතලේ ප්‍රාදේශීය සභා නව බහුකාර්ය ගොඩනැගිල්ලේ පළමු මහල අලුතෙන් ඉදිකරන ලද කඩ කාමර අංක ............ වසර 10 ක කාලයකට බදු දීම සඳහා ලංසු පත් ලබාගැනීමේ ඉල්ලුම් පත්‍රය.**

01. අපේක්ෂිත ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :-..........................................................................
..........................................................................
02. ඉල්ලුම්කරුගේ වර්තමාන ලිපිනය :-..........................................................................
..........................................................................
03. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය :-..........................................................................
04. සම්බන්ධ කළ හැකි දුරකථන අංක 1. ස්ථාවර :-..........................................................................
2. ජංගම :-..........................................................................
3. ඊ තැපැල :-..........................................................................
05. දිස්ත්‍රික්කය :-..........................................................................
06. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :-..........................................................................
07. ග්‍රාම නිළධාරී කොට්ඨාශය හා අංකය :-..........................................................................
08. ව්‍යාපාර ලියාපදිංචි නම සහ අංකය :-..........................................................................

හපුතලේ ප්‍රාදේශීය සභා නව බහුකාර්ය ගොඩනැගිල්ලේ පළමු මහල අලුතෙන් ඉදිකරන ලද කඩ කාමර අංක .............. වසර 10 ක කාලයකට බදු දීම සඳහා ලංසු පත් නිකුත් කරන ලෙස කාරුණිකව මෙයින් ඉල්ලා සිටිමි.

.................................................. ඉල්ලුම්කරුගේ අත්සන :-...............................................

දිනය ඉල්ලුම්කරුගේ නම :-...............................................

ඉල්ලුම්කරුගේ නිල මුද්‍රාව:-...............................................

ටෙන්ඩර් පෝරම හා ආපසු නොගෙවන ලංසු ගාස්තු රු. 5,000.00
ආපසු ගෙවනු ලබන ලංසු ඇප තැන්පත් මුදල රු. 50,000.00

ටෙන්ඩර් පත් භාර ගන්නා අවසන් දිනය - 2024.12.05 අවසන් වන වේලාව - පෙ:ව 10.30

---

.....................................................
.....................................................
.....................................................

හපුතලේ ප්‍රාදේශීය සභා නව බහුකාර්ය ගොඩනැගිල්ලේ පළමු මහල අලුතෙන් ඉදිකරන ලද කඩ කාමර අංක ................ වසර 10 ක කාලයකට බදු දීම සඳහා ලංසු පත් 2024.................................. දින හපුතලේ ප්‍රාදේශීය සභා කාර්යාලයෙන් නිකුත් කරන ලදි.

| **ආපසු නොගෙවන** | | **ආපසු ගෙවන** | |
|---|---|---|---|
| මුදල | ..................................................... | මුදල | ..................................................... |
| ලදුපත් අංකය | ..................................................... | ලදුපත් අංකය | ..................................................... |
| දිනය | ..................................................... | දිනය | ..................................................... |

................................
දිනය

සභාපති
ප්‍රසම්පාදන කමිටුව
හපුතලේ ප්‍රාදේශීය සභාව